සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම;

(ආ) ආගමික මධ්‍යස්ථානවලට ආධාර කිරීම;

(ඇ) නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත්වීමට අවශ්‍ය සියලු උපදෙස් සහ ආධාර ලබා දීම;

(ඉ) පාසල් ළමුන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඊ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙනයාම සඳහා විධිවිධාන සැලැස්වීම;

(උ) පාසල් අධ්‍යාපනය නිම කළ හා පාසල් යන ළමුන් සඳහා පරිගණක ඇතුළු අනෙකුත් අංශවල වෘත්තීය පුහුණුව ලබා දීම;

(ඌ) දිළිඳු පවුල්වල දරුවන් තෝරා ගෙන ඔවුන්ට අධ්‍යාපනය ලබා දීම උදෙසා පොත්පත් ඇතුළු පාසල් උපකරණ හා මූල්‍යමය ආධාර ලබා දීම;

(එ) විද්‍යා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඒ) නිවාස නොමැති දුගී පවුල් සඳහා නිවාස ලබා දීමට ක්‍රියා කිරීම; සහ

(ඔ) රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම.

